# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2028/9 – 2017 ජූලි මස 18 වැනි අඟහරුවාදා – 2017.07.18**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


## I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

*මගේ අංකය*: IR/10/19/2011.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ 2012.09.14 දිනැති හා අංක 1775/21 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2012.09.06 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කැළණිය, සපුගස්කන්ද,ද්‍රව්‍ය අංශය, තෙල්පිරිපහදුව හි පදිංචි යූ. ඒකනායක මයා, සී. එම්. ඩී. එස්. බී. ගුණසිංහ මයා, ජේ.එස්.ඒ.වරුසමාන මයා, ජී. ඩබ්ලිව්. රොබට්සිරි මයා, එච්. ආර්. ප්‍රේමසිරි මයා, ජේ.වී.මිල්ටන් මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 09, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, අංක 609හි පිහිටි ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2017.03.10 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2017 ජුනි මස 28 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව.
කොළඹ 05.


1A – G25909 – 21(2017/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කාර්මික අධිකරණයේ දී ය.

යූ. ඒකනායක මයා,
සී. එම්. ඩී. එස්. බී. ගුණසිංහ මයා,
ජේ. එස්. ඒ. වරුසමාන මයා,
ජී. ඩබ්ලිව්. රොබට්සිරි මයා,
එච්. ආර්. ප්‍රේමසිරි මයා,
ජේ. වී.මිල්ටන් මයා.

තෙල් පිරිපහදුව, ද්‍රව්‍ය අංශය,
සපුගස්කන්ද, කැළණිය.

නඩු අංකය : ඒ.3476

හා

ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව,
අංක 609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,
කොළඹ 09.

අතර වූ කාර්මික ආරවුල.

**ප්‍රදානයයි.**

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් 1957 අංක 14 සහ 1957 අංක 62 හා 1962 අංක 04 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදාන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිතවූ ශ්‍රී ලංකා ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල අනුව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ද්‍රව්‍ය අංශයේ සේවකයින් වන යූ. ඒකනායක, සී. එම්. ඩී. එස්. බී. ගුණසිංහ, ජේ. එස්. ඒ. වරුසමාන, ජී. ඩබ්ලිව්. රොබට්සිරි, එච්. ආර්. ප්‍රේමසිරි, ජේ. වී. මිල්ටන් හා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව අතර වූ කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා 2012.09.06 වැනි දින මා වෙත යොමු කරන ලදී.

ඉහත කී පාර්ශ්වයන් අතර කාර්මික ආරවුලට හේතුවී ඇත්තේ ඉල්ලුම්කරුවන් වෘත්තීය තාක්ෂණික නිලධාරීන් ලෙස නොසැලකීම හේතුවෙන් 1997.08.08 දිනැති වැටුප් ප්‍රතිසංශෝධනය අනුව තාක්ෂණික නිලධාරීන්ට හිමි 15%ක දීමනාව ඔවුනට ලබා නොදීම යුක්තිසහගත ද යන්න හා එසේ නොවන්නේ නම් ඔවුනට හිඟ වැටුප් ගෙවීම කළ යුතු ද යන්න හා හිමිවිය යුතු වෙනත් සහනයන් මොනවා ද යන්න පිළිබඳවය.

එම කරුණ සම්බන්ධයෙන් මූලික සැලකිරීම් දෙපාර්ශ්වය විසින් ලිඛිතව ඉදිරිපත් කිරීමෙන් පසු මෙම නඩුව විභාගයට ගන්නා ලදී. ඉල්ලුම්කරුවන්ගේ ස්ථාවරය වන්නේ සපුගස්කන්ද තෙල් පිරිපහදුවේ ගබඩාභාරකරුවන් වශයෙන් තෙල් පිරිපහදු ක්‍රියාවලියට අත්‍යවශ්‍ය වන්නාවූ විවිධ මාදිලියේ භාණ්ඩ ඉල්ලුම්කරුවන්ගේ ශිල්පීය දැනුම මත මනා අවබෝධයකින් යුතුව ඒ ඒ ද්‍රව්‍යයන්ගේ ස්වභාව සහ අනන්‍යතාවය හඳුනාගෙන ගබඩාකොට සංරක්ෂණය කොට නිසි අවශ්‍යතාවයන් හඳුනාගෙන එකී භාණ්ඩ නිකුත් කරන බවයි.

එසේම ගබඩා කර ඇති භාණ්ඩවලින් බහුතරය ඉංජිනේරු හා රසායනික ද්‍රව්‍ය අඩංගු ඒවා බවත්, ඒවා පරිහරණයේදී හා නිකුත් කිරීමේදී ඉංජිනේරු මිනුම් හා උපකරණ භාවිතය පිළිබඳ දැනුම හා හැකියාව අවශ්‍ය වන බවත්, ඒ අනුව පිරිපහදුවේ ගබඩා භාරකරුවන්ද, ඉල්ලුම්කරුවන්ද කාර්මික ශ්‍රේණියේ සේවකයින් හැටියට සලකා 15% විශේෂ දීමනාව ලබාදිය යුතු බවත් ඉල්ලුම්කරුවෝ ප්‍රකාශ කර සිටිති.

සේවායෝජක ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව කරුණු දක්වා ඇත්තේ ගබඩා භාරකරුවන් වන ඉල්ලුම්කරුවන් තාක්ෂණික හෝ කාර්මික සේවකයින් හැටියට නොසලකන බවයි. ගබඩා භාරකරුවන් සෑම අංශයකටම පොදු තනතුරක් බවත්, ගබඩාවලින් ලබා ගන්නා භාණ්ඩවල කාර්මික තත්වය, තාක්ෂණික තත්වය, එම භාණ්ඩ ඇණවුම් කරන දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුවරුන් හා කාර්මිකයින්ගේ නියෝග හා අධීක්ෂණය අනුව සිදු කරන බවත්, ඉල්ලුම්කරුවන්ගේ වගකීම වන්නේ භාණ්ඩ ගබඩාකර පවත්වාගෙන යාම නිකුත් කිරීම පමණක් බවත්, එම කාර්යය සඳහා විශේෂ තාක්ෂණික ප්‍රාගුණ්‍යයක් අවශ්‍ය නොවන බවත්ය.

මා වෙත යොමු කරන ලද කාර්මික ආරවුලට සම්බන්ධ ඉල්ලුම්කාර පාර්ශ්වයට යූ. ඒකනායක, සී. එම්. ඩී. එස්. බී. ගුණසිංහ, ජේ. එස්. ඒ. වරුසමාන, ජී. ඩබ්ලිව්. රොබට්සිරි, එච්. ආර්. ප්‍රේමසිරි, ජේ. බී. මිල්ටන් යන හයදෙනා අයත් වුවත් මෙම අධිකරණය ඉදිරියේ සාක්ෂි දෙන ලද්දේ යූ. ඒකනායක, සී.එම්.ඩී.එස්.බී.ගුණසිංහ යන දෙදෙනා පමණි. නඩු විභාගයේදී ලකුණු කර ඉදිරිපත් කරන ලද්දේ ඔවුන් දෙදෙනාට අදාළ ලේඛන පමණි.

නඩු විභාගයේ දී මුලින්ම සාක්ෂි දෙන ලද්දේ ඉල්ලුම්කරුවෙකු වූ උපාලි ඒකනායක ය. සාමාන්‍ය සේවකයෙකු ලෙස සංස්ථාවට බැඳුණු බවත්, 1983 වසරේදී සහකාර ගබඩා භාරකරුවෙකු ලෙස උසස්වීමක් ලැබුණ බවත් ඔහු ප්‍රකාශ කළේය. එකී උසස්වීමේ ලිපිය ඒ1 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලදී. 2005 වසරේදී සාක්ෂිකරුට ගබඩා භාරකරුවෙකු ලෙස උසස්වීමක් ලැබී ඇත. ගබඩා භාරකරුවෙකු වෙත පැවරී ඇති කාර්යය විස්තර කරමින් ඔහු ප්‍රකාශ කළේ භාණ්ඩ භාර ගැනීම, සංරක්ෂණය කිරීම, නිකුත් කිරීම, තොග පරීක්ෂා කිරීම, හානි වලක්වාලීම. කල්ගිය හෝ කැඩී බිඳිගිය භාණ්ඩ ඉවත් කිරීමට කටයුතු කිරීම ආදිය බවයි. ගබඩාවල ඇති භාණ්ඩ වලින් වැඩි ප්‍රමාණයක් ඉංජිනේරු කාර්යයන්ට අදාළ භාණ්ඩ බවත්, ගිනි නිවන අංශයට අදාළ ගිනි නිවන උපකරණ ගින්නක් මැඩ පැවැත්වීමට අවශ්‍ය රසායනික ද්‍රව්‍ය නිකුත් කරන්නේද ගබඩාවලින් බවත්, ඔහු ප්‍රකාශ කළේය. එසේම ඉල්ලුම්කරු සැපයුම් හා ද්‍රව්‍ය කළමණාකරණ ආයතනයේ ව්‍යාපාර කළමණාකරණ පුහුණු පාඨමාලාවක් හදාරා ඇති බව ප්‍රකාශ කළේය. කාර්මික ශ්‍රේණියේ සේවකයින්ට ලබාදෙන 15% මාසික දීමනාව ගබඩා භාරකරුවන්ටද ලබාදෙන ලෙස ද්‍රව්‍ය කළමනාකරු මගින් වගකිවයුත්තන්ගෙන් ඉල්ලා සිටියද එම ඉල්ලීම ඉටු නොවුන බව සාක්ෂිකරු ප්‍රකාශ කළේය.

ඉල්ලුම්කරුවෙකු වූ සිසිල් බන්දු ගුණසිංහ සාක්ෂි දෙමින් ප්‍රකාශ කළේ 1980 දී අනියම් සේවකයෙකු ලෙස සංස්ථාවේ සේවයට බැඳුනු ඔහු 1980 දී බී4 ශ්‍රේණියටද, 1985 වසරේදී බී3 ශ්‍රේණියටද උසස්වීම් ලබා 2002 වසරේදී ගබඩා භාරකාර තනතුර ලැබුණ බවයි. ඔහුද ගබඩා භාරකරුවන්ට පැවරී ඇති කාර්යයභාරය විස්තර කළ අතර එම කාර්යය ඉටු කිරීමට කාර්මික දැනුමක් අවශ්‍ය බව ප්‍රකාශ කළේය.

වගඋත්තරකාර පාර්ශ්වයේ ස්ථාවරය වන්නේ යම් සේවකයෙකු කාර්මික ශ්‍රේණියට බඳවා ගැනීමේදී ඒ බව පත්වීම් ලිපියේ සඳහන් කරන බවයි. ඉල්ලුම්කරුවන් කාර්මික ශ්‍රේණියට අයත් සේවකයින්ද යන්න තීරණය කිරීමේදී පත්වීම් ලිපිය වැදගත් ලේඛනයක් ලෙස සැලකිය යුතු ලේඛනයකි. ඉල්ලුම්කරුවෙකු වූ යූ.ඒකනායකගේ මූලික සාක්ෂිය මෙහෙයවමින් ඔහු වෙනුවෙන් පෙනී සිටි නියෝජිත මහතා ඉල්ලුම්කරු ගබඩා භාරකාර තනතුරට උසස් කළ අවස්ථාවේ ලබාදෙන ලද පත්වීම් ලිපිය ඒ5 ලෙස ලකුණු කරමින් ඉල්ලුම්කරුගෙන් අසන ලද ප්‍රශ්නයක් හා ඊට ඉල්ලුම්කරු ලබාදුන් පිළිතුර මෙසේය. (2013.06.19 සාක්ෂි සටහන් පිටුව).

ප්‍ර: පත්වීම් ලිපියේ කිසියම් ස්ථානයක තමුන් කාර්මික ශ්‍රේණියට අයත් නැහැ කියා කොන්දේසියක් තියෙනවද?

පි: නැහැ.

එසේම සේවායෝජක පාර්ශවය වෙනුවෙන් උපාලි ඒකනායක නැමති සාක්ෂිකරුගෙන් ඒ5 ලේඛනය පෙන්වමින් අසන ලද හරස් ප්‍රශ්නය හා ඊට දුන් පිළිතුර මෙසේය.

ප්‍ර: ඉල්ලුම්කරු තමා මේ ආර් 1 (ඒ5) කියන පත්වීම් ලිපියෙන් බඳවාගෙන තියෙන්නේ ගබඩා භාරකාර තනතුරට ?

පි: ඔව්.බී1 ගබඩා භාරකාර තනතුරට.

ප්‍ර: එය කාර්මික තනතුරක් නොවේ එහෙම නේද?

පි: කාර්මික තනතුරක් නොවේ කියා පත්වීම් ලිපියේ නැහැ.

ඒ අනුව ඉල්ලුම්කරුගේ ස්ථාවරය වන්නේ පත්වීම් ලිපියේ කාර්මික තනතුරක් නොවේයයි සඳහන් කර නොතිබීම කාර්මික ශ්‍රේණියට අයත් බවට හේතුවක් වන බවයි. එය කිසිලෙසකින්වත් පිළිගත හැකි කරුණක් නොවේ.

වගඋත්තරකාර පාර්ශවය ටී.ඒ. පියසෝම නැමති සේවකයාගේ කාර්මික ලේඛන භාරකරු (උපකරණ) තනතුරට අදාළ පත්වීම් ලිපිය ආර්2 ලෙස ලකුණු කර ඉදිරිපත් කරමින් එය පත්වීම් ලිපියේ එම තනතුර කාර්මික තනතුරක් බව පෙන්වා දුනි. වග උත්තරකාර පාර්ශවයේ ස්ථාවරය වූයේ ඒ5 පත්වීම් ලිපියේ ගබඩා භාරකාර තනතුර කාර්මික ශ්‍රේණියේ තනතුරක් බව සඳහන් නොවීමෙන් පැහැදිලි වන්නේ එම තනතුර කාර්මික ශ්‍රේණියේ තනතුරක් නොවන බවයි.

ගබඩා භාරකාර තනතුර කාර්මික ශ්‍රේණියේලා සැලකිය යුතු බව තහවුරු කිරීමට ඉල්ලුම්කරුවන් වෙනුවෙන් ඉදිරිපත් කළ තවත් කරුණක් වූයේ ඒ3 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලද අභ්‍යන්තර නිවේදනයේ ගබඩා භාරකරුවෙකුට තිබිය යුතු සුදුසුකමක් ලෙස ඉංජිනේරු ගබඩා හෝ මෝටර් රථ අමතර කොටස් ගබඩාවක පළපුරුද්ද ඉල්ලා තිබීමයි. ගබඩා භාරකරුවෙකු ලෙස කටයුතු කිරීමට එම පළපුරුද්ද අවශ්‍ය වුවත්, ඉල්ලුම්කරුවන් කාර්මික ශ්‍රේණියේ ලා සැලකීමට එය ප්‍රමාණවත් හේතුවක් නොවේ. ඉල්ලුම්කරුවන්ද පිළිගත් කරුණක් වූයේ පිරිපහදුවේ ගබඩාවල තිබෙන භාණ්ඩ ගබඩා භාරකරුවන් නිකුත් කරනු ලබන්නේ ගබඩාවෙන් ඉල්ලා සිටින භාණ්ඩවලට අදාළ ලිඛිත අවසර පත්‍රයක් රැගෙන ආවිට බවත්, අවශ්‍ය භාණ්ඩ කුමන ඒවාද යන්න තීරණය කරන්නේ ඉංජිනේරුවරුන් හා වැඩපරිපාලකයින් විසින් බවත්ය.

වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් සංස්ථාවෙන් නියෝජ්‍ය පිරිස් කළමනාකාරවරිය සාක්ෂි දෙමින් ප්‍රකාශ කළේ කාර්මික ශ්‍රේණියේ තනතුරකට බඳවා ගැනීමේදී විශේෂ පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් තිබීම අවශ්‍ය වන බවය. ඉල්ලුම්කරුවන්ගේ පුද්ගලික ලිපි

ගොනුවල එවැනි වෘත්තීය සුදුසුකම් අඩංගු නොවන බව ද සාක්ෂිකාරිය ප්‍රකාශ කළාය. එසේම නියෝජ්‍ය පිරිස් කළමණාකාරවරිය සඳහන් කළේ ඉල්ලුම්කරුවන් අයත්වන ද්‍රව්‍ය අංශයේ ද්‍රව්‍ය කළමනාකරු, නියෝජ්‍ය ද්‍රව්‍ය කළමනාකරු හා විධායක නිලධාරීන් සිටින බවත්, ඔවුන්ට 15%ක මාසික දීමනාව නොගෙවන බවත් ය.

ඉල්ලුම්කරුවන් වෙනුවෙන් ඒ4 ලෙස ලකුණු කර ලිපියක් ඉදිරිපත් කරන ලදී. එම ලිපිය ගබඩා භාරකරුවන් කාර්මික ශ්‍රේණියෙහි ලා සැලකීම යන මාතෘකාව යටතේ ගබඩා භාරකරුවන් කිහිපදෙනෙකු ද්‍රව්‍ය කළමනාකරු මගින් සංස්ථාවේ සභාපති වෙත යොමු කරන ලද ලිපියකි. එම ලිපියේ ඔවුන් සඳහන් කර ඇත්තේ ගබඩා භාරකරුවන් පිරිපහදු ක්‍රියාවලියට අවශ්‍ය වන විවිධ මාදිලියේ ටර්බයින්, කොම්පෙෂර්, බර ඔසවන යන්ත්‍ර, මෝටර් රථ අමතර කොටස්, රසායනික වායු වර්ග ඇතුළු කාර්මික භාණ්ඩ හා උපකරණ ගබඩාකර සංරක්ෂණය කර අවශ්‍යතාවයන් අනුව නිකුත් කරන බවයි. ද්‍රව්‍ය කළමනාකරු විසින් එම ලිපියේ සටහනක් ද තබා ඇත. ඒ4 ලිපිය යොමු කරමින් පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂිකරුගෙන් අසන ලද ප්‍රශ්නයක් වූයේ,

ප්‍ර : ඒ4 සඳහන් රාජකාරි නොකරනව කියලා කිසියම් පිළිතුරක් වගඋත්තරකරුවන් ලබා දී තියෙනව ද ?

පි : නැහැ

ඉල්ලුම්කරුවන් යවන ලද එම ලිපියට සංස්ථාව පිළිතුරක් ලබා නොදී තිබීම හෝ එම කාර්යයන් නොකරන බව දන්වා නොසිටීම ඉල්ලුම්කරුවන් කාර්මික ශ්‍රේණියට අයත් බව තහවුරු කිරීමට හේතුවක් නොවේ. වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් ද්‍රව්‍ය කළමනාකරු සාක්ෂියට කැඳවිය. ඒ4 ලිපිය පිළිබඳ සඳහන් කරමින් ඔහු ප්‍රකාශ කළේ එම ලිපියේ සඳහන් කර ඇති සටහන ඔහුගේ පුද්ගලික මතය බවයි. ඉල්ලුම්කරුවන් වෙනුවෙන් ඒ13 ලෙස අභ්‍යන්තර නිවේදනයක් ලකුණු කරන ලදී. එහි ගබඩා භාරකාර තනතුරට අදළ පළපුරුදු යටතේ පිරිපහදුවේ භාවිතා වන ඉංජිනේරු, රසායන, වැඩහළ ආයුධ හා අනෙකුත් ද්‍රව්‍ය හා උපකරණ හඳුනා ගැනීම, වර්ගීකරණය හා සංකේත ගත කිරීම පිළිබඳ අවබෝධය ඊ. ආර්. පී. (සැප්) පරිගණක පද්ධති මගින් ගබඩාවේ දෛනික කටයුතු ස්වාධීනව කිරීමේ පූර්ණ හැකියාව දක්වා ඇත.

පිරිපහදුවේ ගබඩා භාරකරුවන් යම්තාක් දුරට අනෙක් අංශවලට ගබඩා භාරකරුවනට වඩා වැඩි වගකීමක් අපේක්ෂා කරන බව ඉදිරිපත් වූ සමහර කරුණුවලින් පැහැදිලි වේ. ඒ අනුව පිරිපහදුවේ ගබඩා භාරකරුවන් කාර්මික ශ්‍රේණියට ඇතුළත් කළ යුතුද යන්න පාලන අධිකාරිය විසින් තීරණය කළ යුතු කරුණකි.

ඉල්ලුම්කරුවන්ගේ පත්වීම් ලිපි, බඳවා ගැනීමේ පටිපාටි, ගබඩාවල භාණ්ඩ නිකුත් කිරීමේ දී ඉංජිනේරුවන්ගේ හා වැඩ පරිපාලකයින්ගේ ඇණවුම් මත පමණක් සිදු කිරීම, පිරිපහදුවේ ගබඩා භාරකරුවන් වෙනත් අංශවලට ද මාරු කළ හැකි පොදු තනතුරක් වීම යන ආදී කරුණු මෙන්ම මෙම නඩු විභාගයේ දී ඉදිරිපත් වූ සාක්ෂි හා ලේඛන ද අනුව ගබඩා භාරකරුවන් කාර්මික ශ්‍රේණියට ඇතුළත් නොවන බව තීරණය කරමි. එම නිසා ඔවුන් වෘත්තීය තාක්ෂණික නිලධාරීන් සේ නොසැලකීම හේතුවෙන් ඔවුන්ට 1997.08.08 දිනැති වැටුප් ප්‍රතිශෝධන අනුව තාක්ෂණික නිලධාරීන්ට හිමි 15% මාසික දීමනාව ලබා නොදීම යුක්ති සහගත බව තීරණය කරමි. ඒ අනුව හිඟ වැටුප් ගෙවීම හෝ වෙනත් සහන හිමිවීමක් ඉල්ලුම්කරුවන්ට හිමි නොවේ.

බේරුම්කරු,
නීතිඥ සරත් ලියනගේ (බී. ඒ.)
සාම විනිසුරු සහ නිළ නොලත් මහෙස්ත්‍රාත්.

2017 මාර්තු මස 10 වැනි දින,
18, නීතිඥ කාර්යාල සංකීර්ණය,
බී. ඩී. එල්. ගුණසේකර මාවත,
හොරණ.

08 - 57

*මගේ අංකය*: IR/10/47/2011.

## කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරිය

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2016.09.09 දිනැති හා අංක 1983/38 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2016.09.02 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් දෙහිඕවිට, යෝගම, හීන් ඇලපිටිය පාර, කුමාර කඩේ බාරේ හි පදිංචි අයි. නිමල් රණතුංග මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2017.03.10 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2017 ජුනි මස 22 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කාර්මික අධිකරණයේ දීය.

අයි. නිමල් රණතුංග මයා.
කුමාර කඩේ බාරේ,
හීන් ඇලපිටිය පාර,
යෝගම,
දෙහිඕවිට.

*නඩු අංකය* : ඒ 3661

*පළමු පාර්ශ්වය*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
අංක. 200,
කිරුළ පාර,
කොළඹ 05.

*දෙවන පාර්ශ්වය*

යන පාර්ශ්වයන් අතර පැවති කාර්මික ආරවුල සම්බන්ධ ප්‍රදානයයි.

**<u>ප්‍රදානය</u>**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය වේලාතන්ත්‍රිගේ දොන් ජෝන් සෙනෙවිරත්න ගරු අමාත්‍යවරයා 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 [1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා] දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහුට පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2016.09.02 දින නියෝගයෙන් මා පත් කොට මා වෙත යොමු කොට ඇත.
උක්ත සඳහන් පාර්ශවයන් අතර පැවති කාර්මික ආරාවුලට හේතු වී පැවති කරුණ වූයේ,

"ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවය කරන අයි.නිමල් රණතුංග මහතාට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 12/95 අනුව නැවත සේවයේ පිහිටුවීමේ දී සේවය නොකළ කාලයට හිඟ වැටුප් ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුවී ඇත් ද යන්න හා එලෙස අසාධාරණයක් සිදුවී ඇත්නම් ඔහුට හිමිවිය යුතු සහනයන් මොනවා ද යන්න පිළිබඳව වේ."

පූර්වෝක්ත යොමුව සම්බන්ධයෙන් 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ අංක 39 දරන ආඥාව යටතේ 1959 මාර්තු මස දෙවැනි දින අංක 11688 දරන *රජයේ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධියට පත් කරන ලද 1969 කාර්මික ආරාවුල් පනත යටතේ නියෝග සංග්‍රහයේ 21(1) දරන නියෝග ප්‍රකාරව මෙම ආරාවුලට හේතු වී ඇති කරුණු පිළිබඳව විස්තර ප්‍රකාශයක් ඉදිරිපත් කරන මෙන් දෙපාර්ශ්වයට ලිඛිතව කාර්මික අධිකරණය මගින් දැනුම් දෙන ලදී.

එකී විස්තර ප්‍රකාශය ඉදිරිපත් කිරීමට වැඩිමනත් කාලයක් වගඋත්තරකරු විසින් ඉල්ලා සිටි අතරතුර යථොක්ත කරුණ විභාගය සඳහා 2016.10.26 දින පෙරවරු 10.00 පැයට නියම කරන ලද්දෙමි.

2016.10.26 දින ඉල්ලුම්කරු තමාම පෞද්ගලිකව පැමිණ සිටි අතර, වගඋත්තරකරු වෙනුවෙන් නීතිඥවරියක් සහ වගඋත්තරකාර පාර්ශවයේ නියෝජිතවරියක් ද පැමිණ සිටිය හ.

එදින ඉල්ලුම්කරු මෝෂන් පත්‍රයක් මගින් සහ තමාම පෞද්ගලිකව කරුණු ඉදිරිපත් කරමින්, තත්කාලයේ වගඋත්තරකාර පාර්ශවය තම සේවකයන් වෙත ඉදිරිපත් කොට ඇති ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැනීම අදහස් කරන බවත්, නීති කෘත්‍යයක් පවත්වාගෙන යාම එකී ක්‍රියාදාමයට බාධාවක් තිබීම ද හේතු කොට ගෙන මෙම කාර්මික ආරාවුල් ක්‍රියාදාමයෙන් තමා කැමැත්තෙන් ම ඉවත් වන බැව් අධිකරණයට දැනුම් දෙන ලදී. එකී නිවේදනය වගඋත්තරකරුගේ නීතිඥ මහත්මිය භාර ගනු ලැබුවා ය. ඒ අනුව තවදුරටත් පෙර දක්වන ලද යොමුව සම්බන්ධයෙන් ක්‍රියා නොකිරීමට තීරණය කොට ඒ බැව් දෙපාර්ශ්වයට දන්වනු ලැබුවෙමි.

ඒ අනුව ගනු ලැබූ තීරණය සාධාරණ හා යුක්තිසහගත බව සහතික කරමි.

**එස්.කාරියවසම්,**
කාර්මික අධිකරණයේ
බේරුම්කරණ මණ්ඩලයේ
සාමාජික.

2017 මාර්තු මස 10 වැනි දින.

08 - 58

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.